# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2141/21 – 2019 සැප්තැම්බර් මස 18 වැනි බදාදා – 2019.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, කුණ්ඩසාලේ හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ, පිච්චමල් වත්ත සේවා ජලාශය ඉදිකිරීම සඳහා, විකල්ප ඉඩම් කොටස් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 09 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
අංක 35 හි පිහිටි
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1501.



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරළේ , ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 278, ගුරුදෙණිය බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිරිමැටිය ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු ජේ. පී. කේ. වීරකෝන් මහත්මිය විසින් මැන සකස් කරන ලද අංක 0394 -බීඑස් දරන මිනින්දෝරු සැළැස්මේ කැබලිඅංක 215, 216 හා 217 වශයෙන් දක්වෙන ''වෙට්ටිගේ වත්ත'' නමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 11.3ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් තුන.

**කැබලි අංක : 215**
**ඉඩමේ ප්‍රමාණය : පර්චස් 25.6**

*මායිම්:*
උතුරට : කැඩැස්තර සිතියම් අංක 320307 (ඉළුක් මෝදර)
නැගෙනහිරට : කැඩැස්තර සිතියම් අංක 320307 හි කැබලි අංක 14
දකුණට : මෙම පිඹුරේ කැබලි අංක 216 හා 217
බටහිරට : මෙම පිඹුරේ කැබලි අංක 214 හා කැබලි අංක 219 (මාර්ගය)

**කැබලි අංක : 216**
**ඉඩමේ ප්‍රමාණය : පර්චස් 12.1**

*මායිම්:*
උතුරට : මෙම පිඹුරේ කැබලි අංක 215
නැගෙනහිරට : මෙම පිඹුරේ කැබලි අංක 223
දකුණට : මෙම පිඹුරේ කැබලි අංක 219 (මාර්ගය)හා කැබලි අංක 222
බටහිරට : මෙම පිඹුරේ කැබලි අංක 217

**කැබලි අංක : 217**
**ඉඩමේ ප්‍රමාණය : පර්චස් 13.6**

*මායිම්:*
උතුරට : මෙම පිඹුරේ කැබලි අංක 215
නැගෙනහිරට : මෙම පිඹුරේ කැබලි අංක 216
දකුණට : මෙම පිඹුරේ කැබලි අංක 219 (මාර්ගය)
බටහිරට : මෙම පිඹුරේ කැබලි අංක 219 (මාර්ගය)

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්:

1. ඩබ්. ඒ. රංජිත් උපේන්ද්‍ර සිල්වා මහතා,
අංක 160/5, කුමුදු මාවත,
ශ්‍රී සෝමරත්න මාවත,
බෙල්ලන්විල,
බොරලැස්ගමුව.

09 – 73

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, ගිරිඋල්ල ජලසම්පාදන ක්‍රමයේ, පිරිපහදු ක්‍රියාවලියෙන් බැහැරවන අපද්‍රව්‍ය, පවිත්‍රකරණය සහ බැහැර කිරීම සඳහා ඉඩම්

කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 09 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
අංක 35 හි පිහිටි
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1495

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1566, මාහරගම, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හාල්පනේ ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. කේ. හේරත් මහතා විසින් මැන සකස් කරන ලද අංක 950 දරන මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ''මීගහකුඹුර'' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි රූඩ් 02 පර්චස් 8.55 ක් පමණ වන ඉඩම් කොටස.

කැබලි අංක : 01
ඉඩමේ නම : මීගහ කුඹුර
ඉඩමේ ප්‍රමාණය : රූඩ් 02 පර්. 8.55

මායිම්:

| | | |
|---|---|---|
| උතුරට | : | ඒ. රංජිත් හිමිකම් කියන අංක 385 පිඹුරේ කැබලි අංක 2, එම්. ඒ. ජේ. එන්. මුණසිංහ සහ තවත් අය හිමිකම් කියන අංක 4053 පිඹුරේ කැබලි අංක 1,2,3,4,5 හා 6 සහ පාර |
| නැගෙනහිරට | : | පාර |
| දකුණට | : | පාර සහ ඩබ්. කේ. සීරියල් ප්‍රනාන්දු හිමිකම් කියන කුඹුර |
| බටහිරට | : | ඩබ්. කේ. සීරියල් ප්‍රනාන්දු හිමිකම් කියන කුඹුර සහ ඒ. රංජිත් හිමිකම් කියන අංක 385 පිඹුරේ කැබලි අංක 2 |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය:

1. එස්. එම්. සුමුදු චාමර සුබසිංහ මහතා,
ගෝනාවිල,
මදුරුගමුව.

09 – 74

---

## ශුද්ධි පත්‍රය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, 2017.10.13 දිනැති අංක 2040/44 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 1A පිටුවේ අංක 10 -1634 යටතේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි මායිම් පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

| | | |
|---|---|---|
| උතුරට | : | මාර්ගය සහ එම්. ඩබ්ලිව්. එස් සෙනෙවිරත්න හිමිකම් කියන රබර් කන්ද |
| නැගෙනහිරට | : | එම්. ඩබ්ලිව්. එස් සෙනෙවිරත්න හිමිකම් කියන රබර් කන්ද සහ මාර්ගය |
| දකුණට | : | මාර්ගය |
| බටහිරට | : | මාර්ගය |

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 09 වැනි දින,
අංක 35,
''ලක්දිය මැදුර', නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1291

09 - 75

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.